## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - 2017

-----------------------------------------------------------

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනතේ 64(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 ඔක්තෝබර් 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් කටුබැද්ද සහ කෙසෙල්වත්ත ව්‍යාපෘතිවල ඇති යන්ත්‍ර හා උපකරණ 2016 වර්ෂය තුළදී එකතු වටිනාකම රු.14,639,740 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණද ගිණුම් ප්‍රමිත 16 ප්‍රකාරව ප්‍රත්‍යාගණිත දින සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ ඡේද අංක 73 (ඊ) අනුව දේපළ පිරියත හා උපකරණ වෙනම සටහනක් මඟින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත්, මණ්ඩලයේ කටුබැද්ද ව්‍යාපෘති අංශයේ එකතු වටිනාකම රු.63,037,977 ක ස්ථාවර වත්කම් පිළිබඳව එලෙස හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පූර්ව වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද රු.924,194 ක් වූ විගණන ගාස්තු ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුමට හර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සටහන්කර තිබුණි. එසේම විගණන ගාස්තු වලට අදාල නොවන හා රු.863,669 ක් ජර්නල් සටහනක් මගින් විගණන ගාස්තු හා ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස සටහන් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු හා ගෙවිය යුතු විගණන ගාස්තු රු.1,787,863 ක් වැඩියෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) (i) පුද්ගලික සමාගමක් වෙත කුලී පදනම මත ලබාදී තිබූ ගොඩනැගිල්ලෙන් 2016 වර්ෂය සඳහා ලැබූ රු.800,029 ක කුලී ආදායම සහ එහි විදුලිය වෙනුවෙන් අයකළ රු.133,890 ක් වර්ෂයේ කුලී ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම රු.933,919 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ii) අදාල සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා කුළී ගෙවීමේදී වැට් බදු වටිනාකම ඇතුළත් නොකිරීම හේතුවෙන් මණ්ඩලය විසින් එම ආදායමෙන් රු.1,385,905 ක් ගෙවිය යුතු වැට් බදු ලෙස වෙන්කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු ආදායම මත සියයට 0.5 ක් ආර්ථික සේවා ගාස්තු සඳහා ප්‍රතිපාදන නොකිරීම නිසා, ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු රු.3,108,214 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් පෞද්ගලික ආයතනයකින් ටී ෂර්ට් 4000 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් ගෙවන ලද රු.1,000,000 ක අත්තිකාරම, අත්තිකාරම් ගිණුම හර කිරීම වෙනුවට ණයහිමි ගිණුම හර කිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් සහ අත්තිකාරම් ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි.

(ඉ) කටුනායක ප්‍රදර්ශනාගාරයේ කුළී ගිවිසුම අනුව 2017 වර්ෂය සඳහා මණ්ඩලය ගෙවිය යුතු මුළු කුළිය රු.25,146,620 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව රු.28,160,340 ක් ලෙස දක්වා තිබීම නිසා වර්ෂයේ කුළී වියදම රු.3,013,720 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. කුළී ගිවිසුම ප්‍රකාරව ප්‍රදර්ශනාගාරයේ විකුණුම් පදනම් කරගෙන මාසිකව ගාස්තුවක් (Concession Fee) ගෙවිය යුතු වුවත්, 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළව ගෙවිය යුතු එම ගාස්තුව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) මණ්ඩලයේ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට බර තැබූ සාමාන්‍ය පිරිවැයට තොගය රු.435,641,415 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.457,642,667 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් අවසන් තොග වටිනාකම, රු.22,001,252 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීමේ ගිණුමක රු.1,010,827 ක ශේෂයක් පැවතියද එය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) තොග ඌනතා හා අතිරික්තතා, තොගයට ගලපා නිවැරදි කිරීම වෙනුවට රු.85,854,835 ක් අවිනිශ්චිත ගිණුම මගින් ගලපා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) මුදල් පොත | 37,818,555 | අදාල ජර්නල් සටහන් 25 |
| (ආ) ප්‍රදර්ශනාගාර 13 ක අතැති මුදල් | 4,673,263 | ප්‍රදර්ශනාගාර කළමනාකරුවන් මගින් අතැති ශේෂය තහවුරු කිරීමේ ලිපි සහ පසු දින බැංකුගත කළ බවට තහවුරු සාක්ෂි |
| (ඇ) ණය කාඩ් ගිණුම හා විකුණුම් ගිණුම් | 337,822,018 | ජර්නල් සටහනට අදාල අනුමැතිය හා නිවැරදිතාවය තහවුරු කිරීමට අදාල තොරතුරු |

| | | |
|---|---|---|
| (ඇ) වෙළඳ නොවන අත්තිකාරම් | 5,120,760 | උපලේඛන සහ ශේෂය පරීක්ෂා කිරීමට ලිඛිත සාක්ෂි |
| (ඉ) කටුබැද්ද ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 10,645,350 | භෞතික සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ඊ) පානදුර කෙසෙල්වත්ත ලුහු ඉංජිනේරු පුහුණු උපකරණ | 3,988,500 | භෞතික සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (උ) බෙන්වොලන්ට් අරමුදල - ජංගම ගිණුම | 2,500,000 | 2017 වර්ෂයේ බැංකු සැසඳුම් වාර්තා, බැංකු ප්‍රකාශන |
| (ඌ) ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය (ණයහිමි) | 6,571,317 | ණයහිමි ලිපිගොණුව සහ ශේෂ සනාථ ලිපි |
| (එ) ලැබිය යුතු තැන්පතු | 17,834,050 | ශේෂ සනාථන ලිපි |
| (ඒ) ලැබිය යුතු කුළී | 1,133,557 | උපලේඛන සහ ශේෂ සනාථන සාක්ෂි විස්තර ඇතුළත් ලිපිගොණු |
| (ඔ) රඳවාගත් මුදල් - කටුබැද්ද | 12,002,564 | ශේෂය සනාථ කිරීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි |
| (ඕ) වෙළඳ ණයහිමි | 30,695,360 | ණයහිමි උපලේඛනය සහ ණයහිමි ලිපිගොණු |
| (ක) වෙළඳ භාණ්ඩ තොගය - (ගබඩා 13 ක) | 28,649,747 | භෞතිකව තොගය පවතින බවට තොග සමීක්ෂණ වාර්තා |
| (ග) හානි වූ තොග | 19,851,107 | භෞතික සමීක්ෂණ වාර්තා |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.45,383,909 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන් වසර 1 ට අඩු ශේෂවල එකතුව රු.33,046,747 ක් ද, වසර 1 සිට වසර 3 දක්වා ශේෂවල එකතුව රු.3,545,631 ක් ද, වසර 3 හා ඊට වැඩි ශේෂවල එකතුව රු.8,791,531 ක් ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.376,117,747 ක් වූ ගෙවිය යුතු වෙළඳ හා අනෙකුත් ණයහිමි ශේෂයෙන් වසර 1 ට අඩු ශේෂවල එකතුව රු.186,583,251 ක් ද, වසර 1 ත් 2 ත් අතර, ශේෂවල එකතුව රු.73,547,495 ක් ද, වසර 2 ත් 3 ත් අතර ශේෂවල එකතුව රු.24,329,151 ක් ද, වසර 3 හා ඊට වැඩි ශේෂවල එකතුව රු.91,657,850 ක් ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ ගෙවා පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 14 දරන වැට් බදු පනතේ III වන පරිච්ඡේදය<br>21 (1) වගන්තිය | 2017 වර්ෂයේ කුළී ආදායම මත වැට් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 231 (I) සහ 237 (ආ) | එකතු වටිනාකම රු.3,207,503 ක ගෙවීම් වවුචර් පත්‍ර 37 ක් භාවිතා කර සැපයුම්කරුවන්ට ගෙවීමේදී ගෙවීමට අදාළ ඉන්වොයිසි සහ භාණ්ඩ ලැබීම් නිවේදන පත්‍ර (GRN) ගෙවීම් වවුචර් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 257 සහ 264 | එකිනෙක වවුචර් පත්‍ර සහතික කිරීමකින් තොරව සහ විධිමත් කුවිතාන්සියක් රහිතව සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් වවුචර් පත්‍ර 312 ක් භාවිතා කර එකතුව රු.56,579,468 ක ගෙවීම් කර තිබුණි. ගෙවීම් වවුචර් පත්‍ර 131 ක් භාවිතා කර එකතුව රු.23,692,235 ක ගෙවීම් කිරීමේදී එම වවුචර් සමඟ භාණ්ඩ ඇණවුම් සහ භාණ්ඩ ලැබීම් නිවේදන පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.<br>4.2.6 වගන්තිය | කාර්ය සාධන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30 ඉකුත් වීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.24,862,164 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.3,917,020 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,945,144 ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම රු.29,684,492 කින් අඩු වුවද, පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.25,000,000 ක් වැඩියෙන් ලැබී තිබීමත්, ආයතනය හා පරිපාලන වියදම් රු.24,063,991 කින් අඩුවීමත් ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ ලාභයක් ලබා තිබුණද, 2015 වර්ෂයේදී ශුද්ධ අලාභයක් ලබා නැවතත් 2016 සහ 2017 වර්ෂවල ශුද්ධ ලාභයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී මණ්ඩලයේ දායකත්වය රු.112,348,260 ක් වූ අතර, එය වාර්ෂිකව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.162,199,937 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මණ්ඩලයේ 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පසුගිය වර්ෂ 04 ක ජංගම වත්කම් අනුපාතය පිළිවෙලින් 1.41 ක්, 1.03 ක්, 0.96 ක් සහ 0.89 ක් වූ අතර, ජංගම වගකීම් වැඩි වීමේ ප්‍රතිශතය, ජංගම වත්කම් වැඩි වීමේ ප්‍රතිශතයට වඩා වැඩි වී තිබීම ජංගම වත්කම් අනුපාතය අඩු වීමට හේතුවී තිබුණි. ක්ෂණික වත්කම් අනුපාතය 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් 0.36 ක්, 0.24 ක්, 0.23 ක් සහ 0.24 ක් විය. ජංගම වත්කම් තුළ විශාල ප්‍රතිශතයකින් තොගය නිරූපණයවීම ක්ෂණික වත්කම් අනුපාතය අඩු වීමට බලපා තිබූ අතර, මණ්ඩලයේ කෙටිකාලීන ද්‍රවශීලතාවය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1. කාර්ය සාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ හැකි පරිදි අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, මණ්ඩලය 2017 වර්ෂය සඳහා වසරක කාලයකට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර එම සැලැස්ම 2017 දෙසැම්බර් 08 දින අනුමත කර තිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) වගන්තිය අනුව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන නොතිබූ අතර, සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම තුළවූ මානව සම්පත් සංවර්ධන සැලැස්මේ, එකිනෙක අරමුණු සඳහා වන ප්‍රතිපාදනයන් හා ඉලක්ක ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනතේ 45 වන වගන්තිය ප්‍රකාරව දක්වා තිබූ මණ්ඩලයේ බලතල හා කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ හස්ත කර්මාන්ත භාණ්ඩ දේශීය අලෙවිය රු.773,477,578 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී එම භාණ්ඩ අලෙවිය රු.721,155,156 ක් දක්වා එනම්, රු.52,322,422 කින් අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ විශේෂ ඇණවුම් යටතේ එකතුව රු.45,000,000 ක ඉලක්කගත අලෙවියක් ලබා කර ගැනීමට සැලසුම් කර තිබූ අතර, සත්‍ය අලෙවිය රු.26,419,508 ක් වීම නිසා, ඉලක්කගත විකුණුම් වටිනාකමින් සියයට 58.7 ක අලෙවියක් පමණක් ලබා කරගෙන තිබුණි.

(ඇ) දේශීය හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්ගෙන් නිෂ්පාදිත භාණ්ඩ මිලදී ගැනීම 2013 වර්ෂයෙන් පසුව අඩු වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ අතර, 2016 වර්ෂයේදී රු.354,146,791 ක් වූ එම මිලදී ගැනීම් 2017 වර්ෂයේදී රු.341,162,863 ක් දක්වා රු.12,983,928 කින් අඩුවී තිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම අනුව නුවරඑළිය සහ මාතලේ ප්‍රදර්ශනාගාර අළුත්වැඩියා කර ආරම්භ කිරීමට මිරිස්ස, පාසිකුඩා සහ යාපනය යන ප්‍රදේශවල නව ප්‍රදර්ශනාගාර තුනක් ආරම්භ කිරීමට, උතුරු නැගෙනහිර ප්‍රදේශවල නව ප්‍රාදේශීය මිලදී ගැණුම් මධ්‍යස්ථාන 02 ක් සහ විදේශ රටවල් 02 ක අලෙවි ප්‍රවර්ධනය සඳහා සාප්පු 02 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, මණ්ඩලයේ පවත්නා මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එම අරමුණු ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අදාල කාලවකවානු තුළ බදු මුදල් නිසිපරිදි නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වැට් බදු රු.3,786,954 ක් ද ජාතිය ගොඩනැගීමේ බදු රු.24,834,476ක් ද ආර්ථික සේවා ගාස්තු රු.19,646,612 ක් ද ගෙවිය යුතුව පැවතුණි.

(ආ) මණ්ඩලයේ පූර්ව කළමණාකාරීත්වය විසින් පසුගිය කාලය තුල නිසි පරිදි මූල්‍ය කළමණාකරණයක් පවත්වා නොගැනීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු දෙකකින් ලබාගෙන තිබූ දිගුකාලීන ණය රු.364,484,163 ක් සමාලෝචිත වර්ෂයට ගෙවිය යුතුව පැවතුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.175,449,133 ක කෙටිකාලීන ණයද ලබාගෙන තිබුණි. එමෙන්ම මෙම ණය සඳහා පොලී ලෙස රු.68,609,778 ක්ද ඊට අමතරව ලබාගෙන තිබූ බැංකු අයිරාව වෙනුවෙන් පොලී ලෙස රු.1,430,334 ක් සමාලෝචිත වර්ෂය තුලදී දැරීමට සිදුව තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට තුම්මුල්ල ප්‍රදර්ශනාගාරය සහ කොළඹ කොටුව ලක්සල ගොඩනැගිල්ල වෙනුවෙන් කොළඹ මහනගර සභාවට ගෙවිය යුතු වරිපනම් බදු එකතු වටිනාකම පිළිවෙලින් රු.3,381,840 ක් හා රු.9,485,849 ක් විය. මෙම හිඟ වරිපනම් ගාස්තු ගෙවන ලෙසත්, එසේ නොවුවහොත් මහනගර සභා අඥා පනත ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණද, කළමනාකරණය ඊට අනුකූලව ක්‍රියා කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට අක්‍රීය බැංකු ජංගම ගිණුම් 05 ක් පැවති අතර, එයින් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.228,369 ක වාසිදායක ශේෂයක්ද, තවත් එක් ජංගම ගිණුමක රු.986,112 ක අයිරා ශේෂයක්ද අනෙක් ජංගම ගිණුමේ ශේෂයක් නොපැවතුණි. මෙම අක්‍රීය බැංකු ජංගම ගිණුම් වසා දැමීමට කළමනාකරණය ක්‍රියා කර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී කොටුව ලක්සල ගොඩනැගිල්ල නවීකරණය සඳහා පෞද්ගලික ආයතනයකට ප්‍රසම්පාදන ක්‍රමවේදයකට අනුකූල නොවන පරිදි කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණි. මෙම ඉදිකිරීමට අදාළව ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, මණ්ඩලයට නිකුත් කළ වාර්තාව අනුව එකතුව රු.30,069,309 ක් මණ්ඩලය විසින් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර ඇති බව වාර්තා කර තිබුණි. නීතිපති දෙපාර්තමේන්තුව 2017 ජූනි 02 දින මෙම මුදල අදාළ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීම සඳහා අන්තරවාසි යවා තිබුණද, එම ගෙවීම කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මෙහි ඉදිරි පියවර ගැනීම සඳහා මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි.

(ඊ) කටුබැද්ද වඩු කර්මාන්ත ව්‍යාපෘති අංශයේ ගොඩනැගිලි නිශ්කාර්යව තිබියදී කොටුව ලක්සල ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය මණ්ඩලයේ ගිණුම් අංශය ඇතුළු අංශ කිහිපයක් පවත්වාගෙන යාම සඳහා වෙනත් ආයතනයකින් කුළී පදනමට සමාලෝචිත වර්ෂයේදීද ගොඩනැගිලි ලබාගෙන තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි කුළී ලෙස රු.9,000,000 ක් ගෙවීම් කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

තුන්මුල්ල ප්‍රදර්ශන භූමියේ පවත්වන ලද වෙළඳපොළ අලෙවිය තුළින් නොවිකිණී ඉතිරිවූ එකතු වටිනාකම රු.789,574 ක රෙදි සහ රෙදිපිළි ආශ්‍රිත නිෂ්පාදන, වෙනත් ප්‍රදර්ශනාගාර වෙතින් නොවිකිණී ඉතිරිවී කටුබැද්ද ගබඩාවට එවා තිබූ එකතු වටිනාකම රු.303,500 ක් වූ ටී ෂර්ට් සහ වෙනත් රෙදිපිළි කටුබැද්ද ගබඩාව තුළ ගබඩා කර තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

2012 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ගාල්ල උණවටුන සළුසල ශාඛාව පිහිටි අක්කර 01 පර්චස් 30.6 ක් වූ ඉඩම හා ගොඩනැගිලි හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත නීත්‍යානුකූලව පැවරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ සඳහා 2012 දෙසැම්බර් 12 දින මණ්ඩලය විසින් ගැණුම් ප්‍රතිෂ්ඨාව ලෙස රු.15,248,575 ක් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත ගෙවීම් කර තිබුණි. මෙම ඉඩම පවරා ගැනීමේ කාර්යය නෛතික ගැටළු මත විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු මස වන විටද නිම කර නොතිබුණි. මෙම ගෙවූ මුදල මණ්ඩලය විසින් කොටුව ලක්සල ඉඩම් ගිණුමට දෝෂ සහිතව හර කර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට වඩු කාර්මිකයින් පුහුණු කිරීමේ කටයුතු නවතා දැමීම හේතුවෙන් කටුබැද්ද ගාලු පාර, අංක 282 හි පිහිටි, අක්කර 02 පර්චස් 21 ක් වූ ඉඩම, එකවර සිසුන් 80 ක් පුහුණු කළ හැකි වර්ග අඩි 11,200 ක් වූ වඩු පුහුණු කර්මාන්තශාලාව සහ එහි සවිකරන ලද යන්ත්‍රෝපකරණ, ඉගැන්වීම් උපකරණ, වර්ග අඩි 2,090 ක දැව ගබඩාව සහ ද්විත්ව ඇඳන් 40 කින් යුතු වර්ග අඩි 4,680 ක් වූ දෙමහල් නේවාසිකාගාරය වසර 06 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීය වත්කම් ලෙස පැවතුණි.

(ආ) 2010 වර්ෂයේ සිට වසර 08 කට අධික කාලයක් ලුහු ඉංජිනේරු පුහුණු කිරීම් සඳහා යොදා නොගැනීම හේතුවෙන් පානදුර කෙසෙල්වත්ත පිහිටි ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවතින එකතුව රු.3,988,500 ක් වටිනා ලුහු ඉංජිනේරු උපකරණ, එකවර සිසුන් 30 ක් පුහුණු කළ හැකි දෙමහල් ගොඩනැගිල්ල, පැරණි ගොඩනැගිලි සහ රූඩ් 01 යි පර්චස් 02 ක පමණ ඉඩම නිෂ්ක්‍රීයව පැවති අතර, මෙම වත්කම් ආරක්ෂා කිරීමට සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,045,969 ක ආරක්ෂක ගාස්තුවක් මණ්ඩලයට ගෙවීමට සිදුවී තිබුණි.

**4.6 මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු**

2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ පසුගිය කළමනාකාරීත්වය විසින් භාර ගන්නා ලද කොන්ත්‍රාත් සහ අනෙකුත් ගෙවීම් නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් මණ්ඩලයට එරෙහිව ගොණු කරන ලද නඩු සඳහා සමාලෝචිත වර්ෂය තුළ නඩු සහ නීතිඥ ගාස්තු ලෙස එකතුව රු.672,342 ක් ගෙවීම් කර තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකාරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ජී3/60/2 සහ 2012 දෙසැම්බර් 21 දිනැති කාර්ය මණ්ඩල අනුමත කිරීමේ ලිපිය ප්‍රකාරව මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලය 127 දෙනෙකු සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 67 දෙනෙකු ලෙස අනුමත සංඛ්‍යාව 194 දෙනෙකු විය. 2017 වර්ෂය අවසානය වන විට සත්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 82 ක් වන අතර, එම ස්ථිර කාර්ය මණ්ඩලයෙන් සේවකයින් 47 දෙනෙකු අනුමත නොවන තනතුරුවල සේවයේ යොදවා තිබුණි. මණ්ඩලයේ සත්‍ය කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ 76 දෙනෙකු සිටි අතර, එම කාර්ය මණ්ඩලයෙන්ද සේවකයින් 21 දෙනෙකු අනුමැතිය නොමැති තනතුරුවල සමාලෝචිත වර්ෂය වන විට සේවයේ යොදවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දිවයින පුරා පවත්වාගෙන යනු ලබන ප්‍රදර්ශනාගාර 12 කින් ප්‍රදර්ශනාගාර 07 ක, ප්‍රදර්ශනාගාර භාර කළමනාකරුවන් ස්ථිර පදනම මත බඳවාගෙන නොතිබූ අතර, කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් වෙත එම ප්‍රදර්ශනාගාරවල සියළු වගකීම් භාරදී තිබුණි.

**5. තිරසර සංවර්ධනය**

**5.1 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මීට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකාවේ පාරම්පරික ග්‍රාමීය හස්ත කර්මාන්ත නිර්මාණකරුවන්ගේ කලා නිර්මාණ මිලදී ගැනීමට වෙන් කරන ලද ප්‍රතිපාදන මෙන්ම දරන ලද සත්‍ය වියදම 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී අඩුවී තිබීම නිසා, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම් යටතේ අපේක්ෂිත දේශීය කලාකරුවන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම්ද අඩුවී තිබුණි.

(ආ) අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක අනුව සෑම අංශයකින්ම භාණ්ඩ මිලදීගනු ලබන ලියාපදිංචි සැපයුම්කරුවන් සහ ක්‍රියාකාරී සැපයුම්කරුවන් වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වුවද, ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා මත සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩ මිලදීගනු ලබන සැපයුම්කරුවන් සංඛ්‍යාවේ අඩු වීමක් නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 02 දින දීය.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

තුන්මුල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය තුළ සහ පිටත Light Board සහ Light Boxes සපයා සවි කිරීමට රු.2,332,074 ක කොන්ත්‍රාත්තුවක් පෞද්ගලික ආයතනයකට 2016 වර්ෂය තුළ ලබාදී තිබුණි. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණු අතර, එම සංග්‍රහයේ 5.3.11 ප්‍රකාරව ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ සත්‍ය වියදම් අතර වැය විෂයයන් 10 ක සියයට 31 සිට සියයට 469 දක්වා පරාසක එකතුව රු.40,959,557 ක ඉක්මවීම් පැවතුණි.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට අදාළව එකතුව රු.2,227,093 ක් දරා තිබූ නමුත්, ඒ සඳහා අයවැය තුළ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත විකුණුම් ආදායම, සත්‍ය විකුණුම් ආදායම සමඟ සැසඳීමේදී අලෙවිසැල් 06 ක සත්‍ය විකුණුම් ආදායමේ අඩුවීම රු.4,967,251 සිට රු.10,464,526 දක්වා සියයට 19 සිට සියයට 43 දක්වා වූ පරාසයක පැවතුණි.

### 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 සහ 2016 වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) විධිමත් පාලනයකින් හා අනුමැතියකින් තොරව ජර්නල් සටහන් යෙදීම හා අංක රහිත ජර්නල් සටහන් පැවතීම<br><br>(ii) පරිගණකගත ගිණුම් ක්‍රමය මගින් ශේෂ පිරික්සුම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම සහ අතීත දින යොදා ගනුදෙනු වර්තමානයේ පරිගණක ගිණුම් පද්ධතියට ගිණුම්ගත කිරීමේ විශේෂ හැකියාව නිසා ගිණුම් ශේෂ පූර්ව විගණනය කිරීමේ අවදානමක් පැවතීම<br><br>(iii) මුදල් පොත් ලිඛිතව පවත්වා නොගැනීම, ගෙවීම් වලට අදාළ ප්‍රතිවිරුද්ධ ලෙජර් ගිණුම මුදල් පොතේ සටහන් නොකිරීම සහ වවුචර් අංක අනුපිළිවෙලින් සටහන් නොකිරීම. |
| (ආ) තොග පාලනය | භෞතික තොග ගණනය සඳහා මාස 07 ක පමණ කාලයක් ගත වීමත්, ප්‍රදර්ශනාගාරවල භාණ්ඩ අලෙවි නොවී පැවතීම මත ඒවා නවීකරණය සඳහා පියවර නොගැනීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතනයේ කාර්ය මණ්ඩලයෙන් සියයට 60 ක් කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබූ අතර, කාලීන අවශ්‍යතාව මත කාර්ය මණ්ඩලය අනුමත කර බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) අලෙවි කළමනාකරණය | දේශීය වෙළඳපොල තුළ අලෙවිය දිගුකාලීනව පහත වැටී තිබූ හස්ත කර්මාන්ත නිෂ්පාදන සම්බන්ධයෙන් හා විදේශීය අලෙවිය පිළිබඳව ආයතනය ඉතා අඩු අවධානයක් යොමුකර තිබීම. |
| (ඉ) අත්තිකාරම් පාලනය | මණ්ඩලය විසින් නඩත්තු කළ අත්තිකාරම් ලේඛනය මුදල් රෙගුලාසි 371 හා 372 ට අනුකූලව පවත්වාගෙන ගොස් නොතිබීම. |